# 2022 ජනවාරි මස පැවැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**දිනය** - **2022.01.06**

**වේලාව** - **පෙ.ව. 10.00**

**ස්ථානය** - **තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**

**පැමිණීම** -

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදානගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | එල්.එච්. කුමුදු සුජීව ප්‍රියන්ත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | චතුමිණි දිල්ශානි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම** -

| | | |
|---|---|---|
| I. | පී.එල්. වාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ ජනවාරි මස විශේෂ මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

එසේම ලැබුවා වූ 2022 නව වසර ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභික මහත්ම මහත්මීන් හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට නිදුක් නීරෝගී වාසනාවන්ත සාර්ථක සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දේපළ 16 ක් 2022 වර්ෂය සඳහා ටෙන්ඩර් කැඳවූ අතර, ඉන් දේපළ 05ක් සඳහා බදුකරුවන් ඉදිරිපත් වූ නිසවෙන්, ඉතිරි දේපළ 12 සඳහා දෙවරක් ප්‍රාදේශීය ටෙන්ඩර් ක්‍රමය යටතේ ටෙන්ඩර් කරනු ලැබුවද බදුකරුවන් ඉදිරිපත් නොවූ බැවින්, එකී දේපළ සඳහා තීරණ ගැනීමට අද දින විශේෂ මහා සභාව පැවැත්වීමට කටයුතු කළ බව ප්‍රකාශ කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන -**

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් දේපළ 2022 වසරට බදු දීම සම්බන්ධව හා ටෙන්ඩර් නොවූ දේපළ 12 සම්බන්ධයෙන් තීරණ ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සභාව සතුව ටෙන්ඩර් කරන ලද දේපළ 16 න් 04 ක් සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් වූ අතර, ඉතිරි දේපළ 12 හි ඇතැම් දේපළ සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් වී ඇති බවත්, දේපළ 06 ක් සඳහා කිසිදු අයදුම්කරුවෙක් ඉදිරිපත් වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.</u>

| අනු අංකය | බදු විෂයය | පළමු වර ටෙන්ඩර් මුදල (රු) | පළමු වර 10% අඩු කළ මුදල (රු) | දෙවන වර ටෙන්ඩර් මුදල (රු) | දෙවන වර 10% අඩු කළ මුදල (රු) | තෙවන වර ටෙන්ඩර් මුදල (රු) | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| 1 | පන්නෙගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය | 2,363,000.00 | 236,300.00 | 2,126,700.00 | 212,670.00 | 1,914,030.00 | කිසිවකු මේ වන විට ඉදිරිපත් වී නොමැත |
| 2 | දෙබරවැව පොදු වෙළඳ පොළ සහ වැසිකිළිය | 2,912,000.00 | 291,200.00 | 2,620,800.00 | 262,080.00 | 2,358,720.00 | කිසිවකු මේ වන විට ඉදිරිපත් වී නොමැත |
| 3 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 1,341,900.00 | 134,190.00 | 1,207,710.00 | 120,771.00 | 1,086,939.00 | දෙවන වර ටෙන්ඩර් මුදලට ටෙන්ඩර් ලබා ගැනීමට අයදුම්කරුවෙකු ඉදිරිපත් විය |
| 4 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 550,980.00 | 55,098.00 | 495,882.00 | 49,588.20 | 446,293.80 | දෙවන වර ටෙන්ඩර් මුදලට ටෙන්ඩර් ලබා ගැනීමට අයදුම්කරුවෙකු ඉදිරිපත් විය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | කිරින්ද පූජා නගර පැරණි වැසිකිළිය සහ නව වැසිකිළිය | 120,000.00 | 12,000.00 | 108,000.00 | 10,800.00 | 97,200.00 | දෙවන වර ටෙන්ඩර් මුදලට ටෙන්ඩර් ලබා ගැනීමට අයදුම්කරුවෙකු ඉදිරිපත් විය |
| 6 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 153,228.00 | 15,322.80 | 137,905.20 | 13,790.52 | 124,114.68 | දෙවන වර ටෙන්ඩර් මුදලට ටෙන්ඩර් ලබා ගැනීමට අයදුම්කරුවෙකු ඉදිරිපත් විය |
| 7 | දෙබරවැව ධීවර වෙළඳසැල | 120,000.00 | 12,000.00 | 108,000.00 | 10,800.00 | 97,200.00 | කිසිවකු මේ වන විට ඉදිරිපත් වී නොමැත |
| 8 | දෙබරවැව පොදු වෙළඳපොළ ධීවර ගොඩනැගිල්ල | 15,000.00 | 1,500.00 | 13,500.00 | 1,350.00 | 12,150.00 | කිසිවකු මේ වන විට ඉදිරිපත් වී නොමැත |
| 9 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | 3,168.00 | 316.80 | 2,851.20 | 285.12 | 2,566.08 | කිසිවකු මේ වන විට ඉදිරිපත් වී නොමැත |
| 10 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් එලදාව (පොල් ගස් 07) | 2,478.60 | 247.86 | 2,230.74 | 223.07 | 2,007.67 | කිසිවකු මේ වන විට ඉදිරිපත් වී නොමැත |
| 11 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ පොල් එලදාව (පොල් ගස් 04) | 4,100.00 | 410.00 | 3,690.00 | 369.00 | 3,321.00 | දෙවන වර ටෙන්ඩර් මුදලට ටෙන්ඩර් ලබා ගැනීමට අයදුම්කරුවෙකු ඉදිරිපත් විය |
| 12 | කිරින්ද සති පොළ | 50,000.00 | 5,000.00 | 45,000.00 | 4,500.00 | 40,500.00 | දෙවන වර ටෙන්ඩර් මුදලට ටෙන්ඩර් ලබා ගැනීමට අයදුම්කරුවෙකු ඉදිරිපත් විය |

<u>එසේම සභාව සතු දේපළ ටෙන්ඩර් කිරීමේ දී, ටෙන්ඩර් නොවූ දේපළ සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් වූ පසු, ඔවුන් විසින් ප්‍රකාශ කරන ලද්දේ පසුගිය කාලවලදී සහ මේ වන විටත් රට තුළ පවතින තත්ත්වයන් නිසා, අප සභාව විසින් ලංසු තබන මුදලෙහි වටිනාකම වැඩි බැවින්, ටෙන්ඩරය ලබා ගත නොහැකි බවයි. එම නිසා මේ සම්බන්ධව පවතින සත්‍යතාවය සොයා බැලීම සඳහා දෙබරවැව සහ පන්නෙගමුව පොදු වෙළඳපොළෙහි 2022.01.01, 02 සහ 2022.01.05, 06 යන දිනයන්හි සභාවේ ආදයම් පරීක්ෂක නිලධාරීගේ අධීක්ෂණය මත, සභාවේ සේවකයින් යොදවා ආදායම් අය කිරීමට මේ වන විට කටයුතු කරන ලදී.</u>

<u>මේ පිළිබඳ වැඩි දුර තොරතුරු දැන ගැනීම සඳහාත්, පන්නෙගමුව දෙබරවැව පොදු වෙළඳපොළවල්හි ආදායම් තත්ත්වය පිළිබඳ දැන ගැනීම සඳහාත් කාරක සභාවක් බවට පත් කරන ලෙසට දන්වන ලදී.</u>

- ✓ මේ පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, පී.කේ. ආරියසේන මහතාගේ සහ කේ.එච්. ගාමිණී මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

සභාව සතු දේපළ ටෙන්ඩර් කිරීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන් පත්තර දැන්වීම් පල කර, එදින සිටම ටෙන්ඩර් දැන්වීම රජයේ ආයතනවල සහ පොදු ස්ථානවල ප්‍රදර්ශනය කිරීමටත්, සමාජ මාධ්‍ය ජාලය ඔස්සේ ද ප්‍රචාරනය කිරීමට කටයුතු කර ඇති බවත් ලේකම්තුමිය විසින් ප්‍රකාශ කරන ලදී.

ආදායම් පරීක්ෂක, එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මහත්මිය විසින් 2022.01.01 සහ 2022.01.02 යන දිනයන්හි දෙබරවැව සහ පන්නෙගමුව පොදු වෙළඳපොළ ආදායම් තත්ත්වය පිළිබඳව තමා විසින් ඉදිරිපත් කර ඇති ආදායම් වාර්තාව සභා ගත කරන ලදී.

- ➢ **<u>පන්නෙගමුව පොදු වෙළඳපොළ.</u>**

2022 වර්ෂය සඳහා පන්නෙගමුව පොදු වෙළඳපොළ ටෙන්ඩර් කැඳවීමේ දී සාර්ථක ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් නොවීම මත, 2022.01.01 සහ 2022.01.02 යන දිනයන්හිදී පන්නෙගමුව තොග සහ සිල්ලර වෙළඳ පොළෙහි පෙළ බදු අය කිරීම සඳහා 2021.12.30 වන දින බලය පවරන ලද ලිපයට අනුව, මාගේ අධීක්ෂණය මත තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ

වෙළඳපොළ පරිපාලක, චමින්ද කොඩිතුවක්කු මහතා, රියදුරු, කේ.එච්. දිනෙත් චන්දිම මහතා සහ වැඩ/ක්ෂේත්‍ර කම්කරු, පී.එම්.කේ. සුනිල් ශාන්ත මහතා යන අය විසින් පොළ බදු මුදල් අය කරන ලදී.

මෙහිදී, තොග පොළ සඳහා වාහන 11 ක් පමණ පැමිණි බවට වෙළඳපොළ පරිපාලක මහතා ප්‍රකාශ කළ අතර, 2022.01.02 වන දින පැවැති සිල්ලර වෙළඳපොළෙහි බක්කි 58 ක් පමණ වෙළඳාම් කිරීමෙන් තොරව හිස්ව පැවැති අතර, මාළු ලැලි 06 ක් සහ රෙදි වෙළඳුන් 06 ක් පමණ වෙළඳාම් කටයුතුවල නිරත වන බව මා හට නිරීක්ෂණය විය. එසේම, කොරෝනා වසංගත රෝගය පැතිරීම හේතුවෙන් 2022 වර්ෂයේ සිට වරින් වර රට වසා තැබීම සහ විවිධ කාල සීමාවන් තුළ නිරෝධායන ඇඳිරිනීති පැනවීම හේතුවෙන් ද පොළ පැවැත්වීම අඩාල වූ අතර, තොග පොළ සඳහා දුර බැහැර ප්‍රදේශවලින් පැමිණෙන වාහන වලින් එම කාල සීමාවේ සිට අඩුවක් පැවැති බවද, වෙළඳුන් විසින් සෘජුවම වගාබිම් වෙත ගොස් අස්වනු මිලදී ගැනීම හේතුවෙන් තොග පොළ සඳහා පැමිණෙන වාහනවල ප්‍රමාණය දිනෙන් දින අඩුවන බව වෙළඳුන් විසින් ප්‍රකාශ කළ අතර, මෙම දිනයේ දී තොග පොළෙහි ආදායම රු. 1,850.00 ක් වූ අතර, සිල්ලර පොළෙහි ආදායම රු. 19,200.00 ක් ලෙස මුළු ආදායම රු. 21,050.00 ක් වූ බවට වාර්තා කරමි.

- <u>දෙබරවැව පොදු වෙළඳපොළ.</u>

2022 වර්ෂය සඳහා දෙබරවැව පොදු වෙළඳපොළ ටෙන්ඩර් කැඳවීමේ දී සාර්ථක ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් නොවීම මත, 2022.01.02 යන දිනයේ දී දෙබරවැව සිල්ලර වෙළඳ පොළෙහි පෙළ බදු අය කිරීම සඳහා 2021.12.30 වන දින බලය පවරන ලද ලිපියට අනුව, මාගේ අධීක්ෂණය මත තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ වෙළඳපොළ පරිපාලක, චමින්ද කොඩිතුවක්කු මහතා, රියදුරු, කේ.එච්. දිනෙත් චන්දිම මහතා සහ වැඩ/ක්ෂේත්‍ර කම්කරු, පී.එම්.කේ. සුනිල් ශාන්ත මහතා යන අය විසින් පොළ බදු මුදල් අය කරන ලදී.

මෙහිදී, පොළට වෙළඳාම් කටයුතු සිදු කිරීමට පැමිණි වෙළඳුන්ගේ ප්‍රමාණය ඉතාමත් අඩු අගයක් බවට මා හට නිරීක්ෂණය වූ අතර, මෙම දිනවල එළවළු මිළ අධික වීම සහ එළවළු හිඟ වීම හේතුවෙන් බොහෝ වෙළඳුන් පොළට වෙළඳාම් කිරීමට නොපැමිණෙන බව පැමිණ සිටි වෙළඳුන් විසින් ප්‍රකාශ කළ අතර, මෙම දින පොළ ආදායම රු. 24,560.00 ක් වූ බවද වාර්තා කරමි.

තවද, පන්නෙගමුව පොදු වෙළඳපළ හා වැසිකිළිය රුපියල් ලක්ෂ පහළොවකටත් (රු. 1,500,000.00) , දෙබරවැව පොදු වෙළඳපළ හා වැසිකිළිය රුපියල් ලක්ෂ දහනවයකටත් (රු. 1,900,000.00) ලබා දෙන ලෙසට ඉල්ලා ලිපි ඉදිරිපත් කර ඇති බව ලේකම්, ඩී.රුචිනා දීපානි මහත්මිය විසින් ප්‍රකාශ කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සභාවට වැඩි ආදායම් මාර්ගයක් ලැබෙන සභාව සතු දෙබරවැව සහ පන්නෙගමුව පොදු වෙළඳපොළ ටෙන්ඩර් නොවීම මත, පසුව තමන් වෙත බදු අයිතිය ලබා දෙන ලෙස දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් හා ආදායම් පරීක්ෂක නිලධාරී මගින් එම දේපළයෙහි අයවන සත්‍ය ආදායම මත පදනම් කර ගනිමින්, ඉල්ලීම් කරන ලද බදුකරුවන් සඳහා ටෙන්ඩර් ලබාදීමට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.</u>

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

මේ මස පැවැති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී මෙම ටෙන්ඩර් නොවූ දේපළ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. එහිදී පන්නෙගමුව පොදු වෙළඳපොළ හා වැසිකිළිය රුපියල් ලක්ෂ පහළොවකටත් (රු. 1,500,000.00) , දෙබරවැව පොදු වෙළඳපළ හා වැසිකිළිය රුපියල් ලක්ෂ 19 කටත් (රු. 1,900,000.00) ලෙසට පුද්ගලයින් දෙනෙදෙකු විසින් ඉල්ලීම් කර ඇති බවට එකී කමිටුවේ දී වැඩි දුරටත් සාකච්ඡා විය. එහිදී කමිටුවේ සියලුම දෙනා ප්‍රකාශ කර සිටියේ, එම දේපල

02 ටෙන්ඩර් ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති මුදලට වඩා වැඩි මුදලක් යම් කෙනෙකු විසින් ඉදිරිපත් කරන්නේ නම්, ඒ පිලිබඳව සලකා බලා කටයුතු කිරීමට හැකියාව පවතින බවයි. නමුත්, එලෙසට කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවී ඇති බව එහිදී සඳහන් කරන ලදී. එම නිසා මේ සඳහා අද දින තීරණයක් ලබා ගෙන ටෙන්ඩර් කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>පන්නෙගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය ලංසු මුදල රු. 2,363,000.00 ක් වුවත්, මෙම දේපළ ටෙන්ඩර් ලබා ගැනීමට එකඟ වී ඇත්තේ රු. 1,500,000.00 ක මුදලකටය. එසේම දෙබරවැව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය ලංසු මුදල රු. 2,912,000.00 ක් වුවත්, මෙම දේපළ ටෙන්ඩර් ලබා ගැනීමට එකඟ වී ඇත්තේ රු. 1,900,000.00 ක මුදලකටය. මෙම පොළවල් දෙක සඳහා ඉල්ලීම් කර ඇති පුද්ගලයින් විසින් ඉල්ලීම් කර ඇති මුදලට ටෙන්ඩරය ලබා දීමට මේ සඳහා සභා සම්මුතියක් අද දින ලබා ගත යුතුය.</u>

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

පොදු වෙළඳපොළ 02 ට අදාළ ටෙන්ඩරය ලබා ගැනීම සිදු නොකිරීමට හේතු වී ඇත්තේ, කොවිඩ් වසංගතය වැඩිපුර ව්‍යාප්තව පැවැති කාලය තුළ පොළවල් හි ආදායම් අඩු වීම හේතුවෙන් ද යන්න විමසන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>පන්නෙගමුව තොග පොළ සඳහා බොහෝ වාහන නොපැමිණීමට හේතු වන්නේ පසුගිය කොරෝනා රෝගය වැඩි පුර ව්‍යාප්ත වූ කාලය තුළ වාහන ගම්මානවලටම ගොස් එළවළු, පළතුරු ආදිය ලබා ගැනීමට කටයුතු කිරීම නිසා, අදටත් එය ඒකාරයෙන්ම සිදු කිරීමයි. එම නිසා තොග පොළ සඳහා මේ වන විට පැමිණෙන්නේ වාහන සීමිත ප්‍රමාණයක් බව සඳහන් කරන ලදී.</u>

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා</u>

ටෙන්ඩර් නොවු දේපළ ලබා ගැනීම සඳහා කිසිවකුත් ඉදිරිපත් නොවන්නේ නම්, අද දින මහා සභාවෙන් තීරණයක් ලබා ගෙන, නීත්‍යානුකූලව එකී කටයුතු කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.

එසේම පොහොර ගැටළුවත් සමඟ නිෂ්පාදනය අඩු වී ඇත. බඩු මිල ඉහල යාමත් සමඟ අලෙවි කර ගැනීමට නොහැකි වන මතය නිසා, වෙළඳාම් කිරීම සඳහා වැඩි බඩු ප්‍රමාණයක් ලබා ගැනීම වෙළඳුන් විසින් සිදු නොකරනු ලබයි. එසේම ජනතාව විසින් බඩු මිලදී ගන්නා ප්‍රමාණය ද බඩුවල මිල අධික වීමත් නිසා බොහෝ සෙයින් අඩු වී ඇත. මෙකී හේතු පදනම් කර ගතහොත්, පොළවල්හි ආදායම් අඩු වීමට බලපා ඇති බව කිව හැකිය.

✓ ගරු සභික, පී.කේ. ආරියසේන මහතාගේ සහ එන්.ජී. සරත් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් කරන ලදී.

✓ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් නොවු දේපළ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා අද දින රැස් වු විශේෂ මහා සභාවේ සියලුම දෙනාගේ අදහස් සලකා බලා සහ දෙබරවැව පොදු වෙළඳපොළ සහ පන්නෙගමුව පොදු වෙළඳපොළෙහි ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් විසින් දින දෙකක් තුළ අය කරන ලද මුදල් ද සලකා බලා, නව අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපි පිළිබඳව ද සලකා බැලීම සිදු කර, එම ඉල්ලුම්කරුවන් වෙත පොළවල් දෙකෙහි බදු අයිතිය ලබා දීම සඳහා දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු, එකී අනුමැතියට යටත්ව ඉල්ලුම්කරුවන් වෙත පොළවල් දෙකෙහි ටෙන්ඩරය ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(උ) වෙනත් කරුණු

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දේපළ 16 ටෙන්ඩර් පටිපාටිය අනුව සෑම වර්ෂයකම ටෙන්ඩර් කිරීම සිදු කරන ලදී. සභාවේ ආදායම් උත්පාදන මාර්ග 2022 වසරට ද ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමේ දී ප්‍රධාන ආදායම් මාර්ග වන පොළවල් දෙක ඇතුළුව දේපළ 06 ක් කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවීම මත, ටෙන්ඩර් කිරීමට නොහැකි විය. එය එසේ වුයේ සභාව විසින් 2022 වර්ෂය සඳහා අප විසින් ඉදිරිපත් කරන ලද ලංසු මුදලට අයදුම්කරුවන් එකඟ නොවීම නිසාය. මෙකී හේතුව මත 10% ක මුදලක් අඩු කර දෙවන වර ටෙන්ඩර් කිරීම සිදු කළත් ඒ සඳහා කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවීය. එම නිසා නැවතත් 10% ක මුදලක් අඩු කර තෙවන වර ටෙන්ඩර් කළද, ඒ සඳහා ද කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවීම මත දේපළ 12 ක් ටෙන්ඩර් කිරීමට නොහැකි විය.

සභාවේ ආදායම් උත්පාදන මාර්ග වන මෙකී දේපළ ටෙන්ඩර් කිරීම සඳහා මහා සභාව විසින් හෝ තීරණයක් ලබා ගත යුතුය. නැතහොත් මේ සම්බන්ධයෙන් අප අධිභාරයකට හෝ ලක් විය හැකිය. මේ සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සාකච්ඡා වුයේ කඩිනමින් විසඳුමක් ලබා ගෙන මෙකී දේපළ ටෙන්ඩර් කළ යුතු බවයි.

දෙබරවැව සහ පන්නෙගමුව පොදු වෙළදපොළවල් 02 හි මේ වන විට සභාවේ නිලධාරීන් යොදවා දින දෙකක ආදායම් අය කිරීම සිදු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තා අනුව, පොළවල් 02 හි වැඩි ආදායම් අය වීමක් සිදු නොවී ඇති බව කිව හැකිය. පන්නෙගමුව තොග පොළ සඳහා දුර බැහැරින් පැමිණෙන වාහන බොහෝ ප්‍රමාණයක් නොපැමිණීම නිසා එහි ආදායම අඩු වීමට හේතු වී ඇති බව සඳහන් කළ හැකිය.

එබැවින්, පොළෙහි බදු අයිතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති පුද්ගලයින් විසින් ඉල්ලීම් කර ඇති මුදල පිළිබඳ සලකා බලා මෙකී දේපළ ටෙන්ඩර් කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී. එසේම ඔවුන් ඉල්ලුම් කරන ලද මුදලට පොළවල් දෙකෙහි ටෙන්ඩරය ලබා දීම සිදු කරන්නේ නම් ඔවුන්ගේ ඉල්ලීමට එම ටෙන්ඩරය ලබා දෙන බැවින්, එය ගිවිසුම් ගත වී ලබා දෙන ලෙසටත්, බදු අය කිරීමේ දී බරපතල හේතුවක් නිසාවෙන් මිසක, කොරෝනා වසංගතය නිසාවෙන් හෝ වෙනත් මතුවන ගැටළුවලදී ඒ සඳහා ආදායම් කපා හැරීමක්, ආදායම් අඩු කිරීමක් සිදු කරන ලෙසට ඉල්ලුම් කළ නොහැකි බවට කොන්දේසියක් ගිවිසුමට එක් කළ යුතු බවටත් දන්වා සිටින ලදී.

එසේම පොළවල් දෙකෙහි බදු අය කිරීම සඳහා ඉල්ලුම් කරන ලද පුද්ගලයින්ගේ ඉල්ලීම්වලට ලබා දීමට කටයුතු කරන්නේ නම්, එය නීත්‍යානුකූලව අනුමැතිය ලබා ගනිමින් ටෙන්ඩරය ලබා දීම සුදුසු බවට දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දේපළ ටෙන්ඩර් කිරීමේ දී දේපළ 12 ක් ටෙන්ඩර් නොවීම මත, පළමු වර, දෙවන වර, තෙවන වර ටෙන්ඩර් කළද, එම අවස්ථාවන් වලදී මෙකී දේපළයන් ටෙන්ඩර් නොවීම නිසා, අද දින විශේෂ මහා සභාවක් ගෙන ඒ සඳහා තීරණයක් ලබා ගැනීමට කටයුතු කිරීම හොඳ දෙයකි. මෙලෙසට දේපළයන් බදු අයිතිය ලබා ගැනීම සිදු නොවීමට හේතු වී ඇත්තේ කොරෝනා වසංගත තත්ත්වය නිසාත්, මේ වන විට බලපා ඇති පොහොර ප්‍රශ්නය නිසාත් බව කිව හැකිය. ප්‍රසම්පාදන දැන්වීම් මගින් පොළවල් සඳහා ඉදිරිපත් කරන ලද ලංසු මුදලට අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම මත, පොළ බදු අය කිරීම පිළිබඳ සභා සම්මුතිය ලබා ගෙන, ඒ

සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ද ලබා ගැනීමෙන් පසු නීත්‍යානුකූලව සිදු කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>**

දෙබරවැව, පන්නෙගමුව පොළෙහි ආදායම් තත්ත්වය සොයා බැලීම සඳහා සභාවේ නිලධාරීන් යොදා දින දෙකක් තුළ ආදායම් අය කිරීම සිදු කරන ලදී. එකී ආදායම් වාර්තා සසදා බැලීමේ දී එම පොළවල් දෙකෙහි ආදායම් බොහෝ සෙයින් අඩු වී ඇති බව දැකිය හැකි කරුණකි. එම නිසා මේ සඳහා ඉල්ලුම් කරන ලද බදුකරුවන් වෙත ඔවුන් ඉල්ලීම් කළ මුදලට පොදු වෙළඳපොළවල් දෙකෙහි බදු අයිතිය ලබා දීම සිදු කරන්නේ නම්, ඉදිරියේ දී කිසිදු ගැටළුවක් ඇති වීමට ඉඩ නොදී, අද දින ගන්නා ලද තීරණය නීත්‍යානුකූලව සිදු කළ යුතු බැවින්, මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර, එම අනුමැතියට යටත්ව ඉල්ලුම්කරුවන් සඳහා පොළ ටෙන්ඩරය ලබා දීම සුදුසු බවට දන්වා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

දෙබරවැව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය සහ පන්නෙගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය ටෙන්ඩරය කිසිදු අයදුම්කරුවෙකු විසින් ලබා නොගැනීම මත, ඉල්ලුම් කර ඇති පුද්ගලයන් විසින් ඉල්ලීම් කර ඇති මුදලට පොළවල් හි බදු අයිතිය ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන, එකී අනුමැතියට යටත්ව පොළවල් දෙකෙහි බදු අයිතිය එකී ඉල්ලුම්කරුවන් වෙත ලබා දීමටත්, එලෙස ටෙන්ඩරය ගිවිසුම් ප්‍රකාරව ලබා දීමේ දී, ගරු විපක්ෂ නායකතුමා ද දක්වන ලද කොන්දේසිය එකී ගිවිසුමට ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙසටත් දන්වා සිටින ලදී.

අද දින විශේෂ මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව පෙ.ව. 11.45 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,<br>
ලේකම්,<br>
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,<br>
ඩබ්ලිව්.ජී. උපුල්,<br>
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.01.06 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී